සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

07 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 33 S I,II

නම: ............................................. ඉතිහාසය කාලය පැය දෙකයි

I කොටස

• අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) අතීතයේ දී හේන **පිටබිම්** ලෙස හඳුන්වා ඇත්තේ,
1. සෙල්ලිපිවල ය. 2. උම්මග්ග ජාතකයේ ය. 3. මහාවංසයේ ය. 4. දීපවංසයේ ය.

02) දසගම් පාලනයට හා අපරාධ නඩු විසඳීමට අදාළ නීති රැසක් සඳහන්ව ඇති සෙල්ලිපිය කුමක් ද?
1. මිහින්තලේ ලිපිය 2. සංගමු විහාර ලිපිය
3. අඹගමුව ලිපිය 4. වේවැල්කැටිය සෙල්ලිපිය

03) නැටුම් ගැයුම් සඳහා දක්ෂතාවක් තිබූ, පළමුවන පරාක්‍රමබාහු රජුගේ බිරිඳ වූයේ,
1. ලීලාවතී බිසව යි. 2. සුගලා බිසව යි. 3. රූපවතී බිසව යි. 4. කල්‍යාණවතී බිසව යි.

04) බෙලිගල ප්‍රදේශයේ දළදා මැදුරක් ඉදිකර වූ පාලකයා කවුරුන් ද?
1. තුන්වන විජයබාහු රජතුමා 2. දෙවන පැරකුම් රජතුමා
3. දෙවන විජයබාහු රජතුමා 4. පළමු බුවනෙකබාහු රජතුමා

05) **ඉලියඩ් හා ඔඩිසි** නම් වීර කාව්‍ය රචනා කරන ලද්දේ,
1. පැසිඩිඩීස් ය 2. තුසිඩිඩීස් ය 3. හෙරඩෝටස් ය 4. හෝමර් ය

• අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුලින් තෝරා හිස්තැන තුළ ලියන්න.

06) මහසෙන් රජු පසු කාලයේ දී ................................ දෙවියන් ලෙස ප්‍රසිද්ධියට පත් විය.

07) පළමු විජයබාහු රජුට උපකාර කළ බුද්ධරාජ නම් සෙන්පතියෙකු පිළිබඳ තොරතුරු ................................... සන්නසේ සඳහන්ව ඇත.

08) ලෝකයේ පවතින සුවිශේෂ සංස්කෘතික උරුම එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ............................ සංවිධානය විසින් ලෝක උරුමයන් ලෙස නම්කර ඇත.

09) නිශ්ශංක අලකේශ්වර ඇමතිවරයා ........................................ බලකොටුවක් තනවා ආර්ය චක්‍රවර්තීන්ගේ හමුදාව පරාජය කරන ලදී.

10) ග්‍රීක ජාතිකයෙකු වන ...................................බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස හැඳින්වේග
(හිපොක්‍රටීස්/ යුනෙස්කෝ/ කතරගම/ ප්ලේටෝ/ කොට්ටේ/ මින්නේරි/ පනාකඩුව/ වල්ලිපුරම)

• අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාල ප්‍රකාශ නිවැරදි නම් ( ✔ ) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

11) කපු කර්මාන්තයේ නිරත පිරිස් අතීතයේ දී පෙහෙකාර ලෙස හඳුන්වා ඇත. ( )

12) ධාතුසේන රජතුමා ලම්භකරණ රාජ වංශයට අයත් රජ කෙනෙකි. ( )

13) රන්මුසු උයන පොළොන්නරුවේ පිහිටි උද්‍යානයකි. ( )

14) කුරුණෑගල රාජධානි සමයේ දී පන්සිය පනස් ජාතක කතාපොත සිංහලයට පරිවර්තනය කරන ලදි. ( )

15) උතුරින් පිහිටි ඇපිනයින් කඳු වැටිය නිසා ඉතාලිය යුරෝපයේ සෙසු රටවලින් වෙන් වේ. ( )



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

• අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල ගැළපෙන නිවැරදි පිළිතුර යොදා හිස්තැන පුරවන්න.

16) අතීත ශ්‍රී ලංකාවේ කන්න තුනක් වී වගාකළ බව .................................... සෙල්ලිපියේ සඳහන් වී ඇත.

17) පැරණි රාජ්‍යය පාලනය සම්බන්ධව සිටි, ඇතුන් පිළිබඳ කාර්‍යයංශයේ ප්‍රධානියා........................................... ලෙස පැරණි සෙල්ලිපිවල හඳුන්වා ඇත.


18) කාශ්‍යප රජු සිය පියා වූ ..........................................රජු ඝාතනය කර රාජ්‍ය පැහැර ගන්නා ලදි.

19) ගම්පොළ රාජධානි සමය අවධියේ .................................... පරපුර යටතේ රයිගම ප්‍රදේශයේ ස්වාධීන රාජ්‍යක් පැවතුනි.

20) පාතිනන් දෙවි මැදුර ....................................... ශිෂ්ටාචාරයට අයත් වටිනා ගෘහනිර්මාණයකි.

## ඉතිහාසය - 7 ශ්‍රේණිය
## II කොටස

• පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
• පිළිතුරු ලිවීම සඳහා වෙන ම කඩදාසි භාවිතා කරන්න.



01) (A) i. මෙම පින්තූරයෙන් දැක්වෙන කාසි වර්ගය හඳුනාගෙන නම් කරන්න.
ii. එය නිපදවා ඇති ලෝහ වර්ගය කුමක් ද?
iii. මෙම කාසිය හමු වූ පුරාවිද්‍යාත්මක ස්ථානය කුමක් ද?
iv. මෙහි දක්නට ඇති සංකේතයක් නම් කරන්න. (ල.04)




(B) i. මෙම පින්තූරයෙන් දැක්වෙන ප්‍රතිමාව දැකගත හැකි විහාරය කුමක් ද?
ii. එය කුමන වර්ගයක බුදු පිළිමයක් ද?
iii. එය පිහිටි පැරණි රාජධානි නගරය කුමක් ද?
iv. මෙම පිළිමය නිපදවා ඇත්තේ මොනවාගෙන් ද? (ල.04)



(C) i. මෙම පින්තූරයෙන් දැක්වෙන අධිරාජයා කවුරුන් ද?
ii. ඔහු කුමන ශිෂ්ටාචාරකට අයත් පාලකයෙක් ද?
iii. එම ශිෂ්ටාචාරය පිහිටි රට කුමක් ද?
iv. මෙතුමාගේ පාලන සමයේ දී ජෙරුසෙලමේ දී උපත ලැබූ ආගමික නායකයා කවුරුන් ද? (ල.04)

(D) මෙහි දැක්වෙන ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
i. කන්කසන්තුරේ පිහිටි A අක්ෂරයෙන් දැක්වෙන පැරණි වරාය කුමක් ද?
ii. බුවනෙකබාහු ආදිපාදතුමා විසින් පිහිටුවා ගන්නා ලද ස්වාධීන පාලන මධ්‍යස්ථානය C අක්ෂරයෙන් දැක්වේ. එය හඳුනාගෙන නම් කරන්න.
iii. ලංකාවේ තුන්වන රාජධානිය වන කුරුණෑගල දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
iv. පැරණි ගොඩවාය වරාය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?




02) i. අතීත ගොවිහු හේන ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ ක්‍රම තුනක් නම් කරන්න. (ල.03)
ii. පස් ගෝ රස හෙවත් ගවයාගේ ලබාගත් පෝෂණ ද්‍රව්‍ය පහෙන් හතරක් නම් කරන්න. (ල.04)
iii. පහත වචන හඳුන්වන්න. (ල.04)
A. නිගම - ..............................................
B. පූග - ..............................................
C. මධුපාවිකා - ..............................................
D. තවලම - ..............................................



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03) i. පළමුවන විජයබාහු රජතුමා ගැන හැදෑරීමේ දී වැදගත් වන මූලාශ්‍රය තුනක් නම් කරන්න. (ල.03)

ii. පහත සඳහන් වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න. (ල.04)

| ඡායාරූපය | හඳුන්වන නම | පිහිටි ප්‍රදේශය | කරවන ලද පාලකයා |
|---|---|---|---|
|  | පුවරු ලිපිය | A. ........................ | B. ........................ |
|  | C. ........................ | දැදිගම | මහා පැරකුම් රජු |
|  | රාජසභා මණ්ඩපය | D. ........................ | නිශ්ශංකමල්ල රජු |

iii. නිශ්ශංකමල්ල රජුට පොළොන්නරුවේ රජවීමේ දී මුහුණ දීමට සිදු වූ අභියෝග හතරක් නම් කරන්න. (ල.04)

04) i. ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක සංස්කෘතික උරුම තුනක් නම් කරන්න. (ල.03)

ii. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සාම්ප්‍රදායික කලා ශිල්පයන් හතරක් නම් කරන්න. (ල.04)

iii. විවිධ රටවල, සමාජයන්හි අනන්‍යතාව විද්‍යමාන වන ආකාර පහක් යුනෙස්කෝ සංවිධානය හඳුන්වාදී ඇත. ඉන් හතරක් නම් කරන්න. (ල.04)

05) i. දඹදෙණිය රාජ්‍ය සමය වනවිට ලංකාව බෙදී තිබුණු ප්‍රාදේශීය බෙදීම් තුන නම් කරන්න. (ල.03)

ii. දෙවන පරාක්‍රමබාහු රජුගෙන් සිදු වූ සේවාවන් හතරක් නම් කරන්න. (ල.04)

iii. පහත සඳහන් සිදුවීම් සිදු වූ රාජධානි සමය තෝරා නිවැරදිව වගුවේ ලියා දක්වන්න. (ල.04)


A. කව්සිළුමිණ නම් ග්‍රන්ථය රචනා කිරීම
B. ඉබන් බතූතා නම් අරාබි ජාතික සංචාරකයා ලංකාවට පැමිණීම
C. ඇම්බැක්කේ දේවාලය ඉදිකිරීම
D. රජ වාසලේ ඇති වූ කුමන්ත්‍රණයකින් හතරවන විජයබාහු රජතුමා මිය යාම

| දඹදෙණිය රාජධානිය | ගම්පොළ රාජධානිය |
|---|---|
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |

06) i. පෞර රාජ්‍යවල කැපී පෙනෙන ලක්ෂණ තුනක් නම් කරන්න. (ල.03)

ii. ග්‍රීක ශිෂ්ටාචාර සමයේ සිටි සුප්‍රසිද්ධ නාට්‍යකරුවන් හතර දෙනෙකු නම් කරන්න. (ල.04)

iii. පහත ඡායාරූප හඳුනාගෙන නම් කරන්න. (ල.04)

A

..........................

B

..........................

C

..........................


D

..........................



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

07) පහත ඡායාරූප සටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

<table>
<tr><td></td><td>A</td><td rowspan="4">1) ඉංග්‍රීසි A අක්ෂරයෙන් දැක්වෙන උපකරණය කුමක් ද?<br>..............................................(ල.01)<br><br>2) එම උපකරණ භාවිත කරන කර්මාන්තය කුමක් ද?<br>..............................................(ල.01)<br><br>3) එම කර්මාන්තයේ නිරත පිරිස් අතීතයේ දී හඳුන්වා ඇත්තේ කෙසේද?<br>..............................................(ල.01)<br><br>4) පැරණි පොළොන්නරු නගරයේ දී දැක ගත හැකි නිර්මාණ දෙකක් මෙහි දැක්වේ ඒවාට අදාළ ඉංග්‍රීසි අක්ෂර දෙක නම් කරන්න..................................ල.02)<br><br>5) ඉංග්‍රීසි B අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමන කාර්යයක් සඳහා යොදාගත් ගොඩනැගිල්ලක් ද?<br>..............................................(ල.01)<br><br>6) එය පිහිටි ප්‍රදේශය කුමක් ද?<br>..............................................(ල.01)<br><br>7) ඉංග්‍රීසි D අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල හඳුන්වන නම කුමක් ද?<br>..............................................(ල.01)<br><br>8) එම ගොඩනැගිල්ල එම ගොඩනැගිල්ල ඉදිකරවන ලද පාලකයා කවුරුන් ද?<br>..............................................(ල.01)<br><br>9) ඉංග්‍රීසි C අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල ඉදිකරවන ලද පාලකයාගේ මව හා පියා නම් කරන්න.<br>..............................................(ල.02)</td></tr>
<tr><td></td><td>B</td></tr>
<tr><td></td><td>C</td></tr>
<tr><td></td><td>D</td></tr>
</table>



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com